‘මා ප්රතික්ෂේප කළ අය හැර, මාගේ සෙසු සමූහයා සියල්ලෝම ස්වර්ගයට පිවිසෙති

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. ‘මා ප්රතික්ෂේප කළ අය හැර,
මාගේ සෙසු සමූහයා සියල්ලෝම ස්වර්ගයට පිවිසෙති.’ "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ප්රතික්ෂේප කරන්නේ කවුරුන්දැ?’යි ඔවුහු විමසා සිටියෝය. එතුමා, 'කවරෙකු මට අවනත වූයේ ද ඔහු ස්වර්ගයට පිවිසීය. කවුරුන් මට පිටුපෑවේ ද ඔහු ප්රතික්ෂේප කළේය.’යැයි කීහග
[صحيح] [رواه البخاري]

වැළකී සිටි අයකු හැර තම ප්රජාවේ සියලු දෙනා පාහේ ස්වර්ගයට පිවිසෙන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියි. 'අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! එසේ වැළකී සිටින්නේ කවුරුන් දැ?'යි සහාබාවරු (රළියල්ලාහු) විමසා සිටියෝය. එවිට එතුමාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) පිළිතුරු දෙමින්, 'කවරෙකු යටත් වී පිළිපදිමින් අල්ලාහ්ගේ දූතයාණන්ට අවනත වූයේ ද ඔහු ස්වර්ගයට පිවිසීය. කවරෙකු පිටු පා ෂරීආ නීතියට යටත් නොවූයේ ද සැබැවින්ම ඔහු ඔහුගේ නපුරු ක්රියා හේතුවෙන් ස්වර්ගයට පිවිසීමෙන් වළකනු ලැබීය.'

http://sunnah.global/hadeeth/si/show/4947